8th International Conference of Multidisciplinary Approaches (iCMA), 2021
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# පුද්ගල සාක්ෂරතාව සහ සේවා නියුක්තිය අතර පවතින සම්බන්ධතාව පිළිබඳ අධ්‍යයනයක්

කරුණාරත්න එම්.එම්.එස්.ඒ.*, ජයසිංහ එන්.එම්.ඒ. සහ ප්‍රියදර්ශනී අයි.ටී.එන්.

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
samadhiabhisheka@sjp.ac.lk

**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාව තුළ 2007-2020 කාල සීමාවට අදාළ පුද්ගල සාක්ෂරතා අනුපාතය සහ සේවා නියුක්තිය අතර පවතින සම්බන්ධතාව අධ්‍යයනය කරන ලදි. ඒ අනුව ස්වායත්ත විචල්‍යය ලෙස පුද්ගල සාක්ෂරතා අනුපාතය යොදාගත් අතර, පරායත්ත විචල්‍යය ලෙස සේවා නියුක්ති පුද්ගලයන් සංඛ්‍යාව යොදා ගන්නා ලදි. මෙහි දී වාර්ෂික මහ බැංකු වාර්තා පදනම් කර ගනිමින් දත්ත රැස් කරන ලදි. සාක්ෂරතා අනුපාතය සහ සේවා නියුක්තියට අදාළ ව යොදා ගන්නා ලද දත්තයන් ප්‍රමත ව ව්‍යාප්ත නො වීම හේතුවෙන් එම දත්ත විශ්ලේෂණයේ පහසුව සඳහා ලොග් සංඛ්‍යා බවට පරිවර්තනය කරන ලදි. ඒ අනුව සාක්ෂරතා අනුපාතය සහ සේවා නියුක්තිය අතර පවතින සම්බන්ධතාව අධ්‍යයනය කිරීම සඳහා සරල රේඛීය ප්‍රතිපායනයක් සිදු කරන ලදි. එහි දී ස්වායත්ත විචල්‍යය සහ පරායත්ත විචල්‍යය අතර අනුලෝම හෙවත් ධන සම්බන්ධතාවක් පවතින බව හඳුනාගත හැකි විය. ඒ අනුව ලැබුණු සරල රේඛීය ප්‍රතිපායන සමීකරණය $E = 1.356 + 2.819\mathrm{L}$ වේ. මේ අනුව පැහැදිලි වනුයේ පුද්ගල සාක්ෂරතා අනුපාතය එක ඒකකයකින් ඉහළ යන විට සේවා නියුක්තිය 2.819කින් ඉහළ යන බව ය. මේ අනුව පර්යේෂණ ප්‍රතිඵල මත පදනම් ව ඉදිරිපත් කළ හැකි යෝජනා කිහිපයකි. එනම් සංවර්ධනය වෙමින් පවතින රටක් ගණයෙහි ලා සැලකෙන ශ්‍රී ලංකාව ඉහළ ආර්ථික වර්ධනයක් කරා ගමන් කිරීමේ දී සේවා නියුක්තිය ඉහළ නංවා ගැනීම අත්‍යවශ්‍ය වන අතර, ඒ සඳහා පුද්ගල සාක්ෂරතාව ධනාත්මක බලපෑමක් ඇති කරන බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. එහි දී සාක්ෂරතා අනුපාතය ඉහළ නැංවීම සඳහා ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය කිරීම, අධ්‍යාපනය නගා සිටුවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, දුෂ්කර පාසල් සහ ඒවායේ අධ්‍යාපනය ලබන දරුවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම මෙන් ම අවශ්‍ය පහසුකම් සපයා දීම වැනි උපායමාර්ග හරහා සේවා නියුක්තිය ඉහළ නංවා ගැනීමට යොමු වීම වැදගත් වේ.

**ප්‍රමුඛ පද:** *අධ්‍යාපනය, ශ්‍රී ලංකාව, සාක්ෂරතාවය, සේවා නියුක්තිය*